# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/47 - 2022 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට, බිංගිරිය, උඩුබද්දාව හා මාකඳුර, පන්නල, කුලියාපිටිය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, පෙතිගොඩගෙදර සන මීටර් 1500ක ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල**,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/KG/526.
2022 දෙසැම්බර් මස 08 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1508, වල්පිටගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඹුරුගොඩ ගමේ පිහිටි, මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද අවසාන ගම්පිඹුරු අංක 298, පත්‍ර අංක 14, අතිරේක අංක 14හි කැබලි අංක 114 වශයෙන් දැක්වෙන "කන්දෙටියවත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 49.4ක් පමණ වන ඉඩම් කොටස :

**මායිම් :**

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *දකුණට* | : | කැබලි අංක 115 හා 116 ; |
| *බටහිරට* | : | කැබලි අංක 113. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර,
ගනේහේන,
බත්තරමුල්ල.

EOG 12 - 0181